ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. SGLG/RT/A/BLPS/FA/05/2022/14 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2023 අප්‍රේල් 17 දින.

බලංගොඩ ... සභාව
24 APR 2023
617
දිය ... .

ලේකම්,

බලංගොඩ ප්‍රාදේශීය සභාව.

**බලංගොඩ ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(I) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

වී.පී.එම්. කුමානායක,

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති,

විගණකාධිපති වෙනුවට.

පිටපත :- පළාත් පාලන කොමසාරිස්, සබරගමුව පළාත් සභාව - කා.දැ.පි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. SGLG/RT/A/BLPS/FA/05/2022/14 ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2023 අප්‍රේල් 17 දින.

ලේකම්,

බලංගොඩ ප්‍රාදේශීය සභාව.

**බලංගොඩ ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(I) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

බලංගොඩ ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව ඉදිරිපත් කළයුතු මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට බලංගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ස්ථාවර වත්කම් වැඩිදියුණු කිරීම සඳහා වැය කරන ලද රු.10,018,820ක් ප්‍රාග්ධනිත නොකිරීම හේතුවෙන් ජංගම නොවන වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී පරිත්‍යාග වශයෙන් ලද ස්ථාවර වත්කම් වල වටිනාකම මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය මගින් ගලපා නොතිබීමෙන් ප්‍රාග්ධන ආදායම හා ප්‍රාග්ධන වියදම රු.8,012,045කින් අඩුවෙන් දැක්වුණි.

(ඇ) සභාව සතු බැකෝ යන්ත්‍රය ජනදිරිය වැඩසටහන හා වෙනත් සුභසාධන කටයුතු සඳහා ලබාදීමට අදාළව රු.3,612,605ක උපකල්පිත කුලී ආදායමක් හා වියදමක් ගිණුම්ගත කර තිබීමෙන් මෙහෙයුම් ආදායම හා වියදම එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ලැබී තිබුණු ස්ථාවර තැන්පත් පොළී ආදායම ලැබිය යුතු පොළී ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබීමෙන් හිඟහිටි ආදායම රු.770,685කින් වැඩියෙන් දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව ප්‍රාදේශිය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තිය විනිශ්චය සහ වෘත්තිය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 **අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සමස්ථ කාර්යය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් සකස් කර නොතිබුණි. |
| (ආ) 2017 ජූලි 25 දිනැති අංක 02/2017 දරන ජාතික අයවැය චක්‍රලේඛය | නිමවුම් දර්ශක හා ප්‍රධාන කාර්යසාධන දර්ශක හඳුනාගෙන නොතිබුණි. |

| | |
|---|---|
| (ඇ) 2018 ජූලි 19 දිනැති අංක 2018/ඉ-පළාත් පාලන 01 දරන පළාත් පාලන චක්‍රලේඛය | සේවාලාභීන්ට අන්තර්ජාලය හරහා සේවාවන් අයදුම් කිරීමට අවශ්‍ය පහසුකම් ස්ථාපිත කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,267,712ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.10,653,255ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,378,381 | 1,083,059 | 1,030,861 | 134,681 | 1,833,380 | 1,051,400 | 1,080,234 | 100,845 |
| කුලී | 9,091,650 | 6,222,837 | 5,934,426 | 86,057 | 8,414,900 | 4,517,336 | 4,262,890 | 244,839 |
| බලපත්‍ර ගාස්තු | 905,500 | 881,370 | 896,120 | - | 588,500 | 1,021,960 | 922,580 | - |
| වෙනත් ආදායම් | 5,489,500 | 11,573,436 | 10,908,834 | - | 4,335,500 | 5,617,773 | 5,716,706 | 345,684 |
| | 16,865,031 | 19,760,702 | 18,770,241 | 220,738 | 15,172,280 | 12,208,469 | 11,982,410 | 691,368 |

සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟ ආදායම රු.691,368ක් වූ අතර, වර්ෂයේ බිල්කිරීම රු.19,760,702ක් විය. ඒ අනුව වර්ෂය තුළ රැස්කළ යුතු සමස්ථ ආදායම රු.20,452,070ක් වුවද, රැස් කරන ලද ආදායම රු.18,770,241ක් වීමෙන් තවදුරටත් රැස්කර ගතයුතු ආදායම සමස්ථ ආදායමේ ප්‍රතිශතයක් ලෙස සියයට 08ක මට්ටමක පැවැතිණි.

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

---

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කළ ආදායම සමඟ සැසඳීමේදී සේවා සඳහා ගාස්තු යන ආදායම් විෂයයේ රැස්කළ ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා 147කින් වැඩි වී තිබුණු අතර, වරිපනම් හා බදු, බදු කුලී ආදායම, වරෙන්තු හා දඩ සහ වෙනත් ආදායම් යන ආදායම් විෂයයන්ගේ රැස්කළ ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 25කින්, 35කින්, 77කින් හා 51කින් අඩු වී තිබුණි.

2.2.3 වරිපනම් හා බදු

---

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.68,645ක් වූ හිඟ අක්කර බදු ශේෂය තුළ වසර 03කට වඩා වැඩි කාලයක සිට පැවැත එන ඒකක 122කින් අයවිය යුතු රු.49,814ක් ඇතුළත් වී තිබුණි.

(ආ) යකහළු මුකලාන ඉඩමේ බිම්බදු පදනම මත ලබා දී තිබුණු බිම් කොටස් 19ක් සඳහා තක්සේරු වාර්තා නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වනවිට බදුකරුවන්ගෙන් වසර 01ත් වසර 17ත් අතර කාලයක් සඳහා රු.21,300ක් අයවිය යුතු ව පැවැතිණි.

2.2.4 කුලී

----

වෙළිඔය ආර්ථික මධ්‍යස්ථානයේ කඩකාමර 02කින් හා දූවිලි ඇල්ල සංචාරක මධ්‍යස්ථානයේ කඩකාමරයකින් හිඟහිටි රු.64,756ක් ශිව්සුම් ඇප මුදලින් හෝ අයකර නොතිබුණි.

2.2.5 බලපත්‍ර ගාස්තු

---

ආයතන 09ක් විසින් 2022 වර්ෂය සඳහා වූ සිය බලපත්‍ර, 2023 පෙබරවාරි වන විටත් අලුත් නොකිරීම වෙනුවෙන් අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

2.2.6 වෙනත් ආදායම්

---

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ප්‍රදර්ශිත දැන්වීම් පුවරු හඳුනාගැනීමට සමාලෝචිත වර්ෂය තුළ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. මේ නිසා අයකළ දැන්වීම් පුවරු ගාස්තුවල නිවැරදිතාව තහවුරු කරගත නොහැකි විය. එමෙන්ම, ආයතන 04කට අදාළ දැන්වීම් පුවරු 11ක් වෙනුවෙන් 2021 හා 2022 වර්ෂ සඳහා අයවිය යුතු රු.169,260ක් අයකර නොතිබුණි.

(ආ) දුරකථන සමාගම් 03කට අයත් දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 03කින් 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා හිඟහිටි රු.27,000ක් අයකර ගෙන නොතිබුණි.

2.2.7 උසාවි දඩ

---

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2022 දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු. 1,098,495ක් විය.

2.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පොල්වතුගොඩ, මහවලතැන්න ඉඩමේ සමෝච්ඡ රේඛා සිතියම හා භූමි යෝග්‍යතා සහතිකය ලබා ගැනීමට 2021 හා 2022 වර්ෂවල දී රු.183,124ක් ගෙවා තිබුණ ද, 2023 ජනවාරි දක්වාම එම කාර්යයන් ඉටු වී නොතිබුණි. මේ නිසා ඉඩම පවරාගත නොහැකි වීමෙන් රාස්සගල කුඩා නගර සංවර්ධන සැලැසුම ක්‍රියාත්මක කළ නොහැකි වී තිබුණි.

(ආ) වෙලිඔය නගරයේ 2015 වර්ෂයේ දී ඉදිකළ රු.27,253,473ක් වූ දෙමහල් ගොඩනැගිල්ල 2022 වර්ෂය අවසන් වනවිටත් අභාවිතව පැවැතිණි.

(ඇ) අනවසර ඉදිකිරීම් හඳුනාගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් නොතිබුණි. 2021 සහ 2022 වර්ෂ තුළ හඳුනාගත් අනවසර ඉදිකිරීම් 29ක් නියමානුකූල කර ගන්නා ලෙස දන්වා යවා තිබුණ ද, ඒ පිළිබඳ පසුවිපරම් කර නොතිබුණි.

(ඈ) සමිති 58ක් වෙත රු.830,300ක ශ්‍රියුම් පයිප්ප ලබා දී තිබුණ ද, ඒවා අරමුණුගත කාර්යයන් සඳහා යෙදවූයේ ද යන්න පිළිබඳ පසුවිපරම් කර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

#### ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

විධිමත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය වැඩසටහනක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර, රැස්කරන අපද්‍රව්‍ය අවිධිමත්ව හා පරිසර හිතකාමී ක්‍රමවේදයකින් තොරව භූමියට බැහැර කර තිබුණි. එමෙන්ම, 2022 අගෝස්තු මාසයේ දී පළාත් සභාවෙන් ලද රු.950,000ක් වූ බේලර් යන්ත්‍රය තෙකලා විදුලිය නොමැති වීමෙන් ලද දින සිට අභාවිතව පැවතුණි.

### 3.2 මානව සම්පත් කළමනාකරණය

#### සේවක පුරප්පාඩු හා අතිරික්ත

අනුමත කාර්යය මණ්ඩලයේ තනතුරු 93කින් 2022 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු 19ක් හා 15 දෙනෙකුගේ අතිරික්ත පැවැතිණි.

3.3 ප්‍රසම්පාදනය

---

සභාවට නීතිඥ සේවා ලබා ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රමවේදයෙන් බැහැරව හා විධිමත් ගිවිසුමකට එළැඹීමකින් ද තොරව මහා සභාවේ අනුමැතිය මත නීතිඥවරයෙකු තෝරා පත්කර ගෙන තිබුණි.

3.4 කොන්ත්‍රාත් පරිපාලනය

---

බලංගොඩ ප්‍රාදේශීය සභා ගර්භයේ ලී වේදිකාව සැකසීම සඳහා ජාතික පුවත්පතක දැන්වීම් පළකර ප්‍රසම්පාදන කැඳවා තිබුණද, එම දැන්වීම මඟින් සබරගමු පළාතේ ලංසුකරුවන්ට පමණක් ලෙස සීමාවක් යොදා තිබීමෙන් සුදුසුකම්ලත් සියලු ලංසුකරුවන්ට ලංසු ඉදිරිපත් කිරීමේ අවස්ථාව අහිමි වී තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---

අයවැය පාලනය

---

පහත සඳහන් කරුණු හේතුවෙන් වාර්ෂික අයවැය මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

(අ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 09කට අදාළව එකතුව රු.39,018,000ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 12කට අදාළව එකතුව රු.21,275,800ක් වූ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 56 සිට සියයට 99 දක්වා පරාසයක ඉතිරිවීම් තිබුණි.

ඩී.පී.එම්. කුමානායක.
ජ්‍යෝෂ්ඨ සහකාර විගණකාධිපති,
විගණකාධිපති වෙනුවට.